**ලේක්හවුස් ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් - 2015**

---

2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලේක්හවුස් ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්හි ("සමාගම") මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්වයක් (කුමපඅ සඳහා ශ්‍රීලංමුවාප්‍ර) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය") වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2.** **මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**2.1** **මතය**
**--------**

මූල්‍ය ප්‍රකාශනවලින්, 2015 දෙසැම්බර් 31 දිනට ලේක්හවුස් ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්හි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්වයක් (කුමපඅ සඳහා ශ්‍රීලංමුවාප්‍ර) සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**-------------------------------------------**

**2.2.1** **සමාගමේ අඛණ්ඩ පැවැත්ම**
**--------------------------------**

1985 ආරම්භ කර ඇති මෙම සමාගම ආරම්භ කර අවු.30 ක් ගත වී ඇතත් සමාගමේ වාණිජ ගනුදෙනුවක් ආරම්භ වී නොමැත. 2013 වර්ෂයේදි සමාගමට අයත් ඉඩමකින් මුදල් ප්‍රවාහයන් ජනිත කිරීමේ හැකියාව තිබියදී මව් සමාගම එය අත්පත් කරගැනීම නිසා සමාගමේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි එය ඍජු බලපෑමක් ඇති කරයි.

**3.** **මූල්‍ය සමාලෝචනය**
**---------------------------**

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**
**------------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය බදුවලට පෙර ශුද්ධ ලාභය රු.671,014 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු වලට පෙර ශුද්ධ ලාභය රු.1,111,549 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.440,535 ක පිරිහීමක් දැක්වුණි. පොලී ආදායමේ අඩුවීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**
**--------------------------------**

**4.1** **හඳුනාගත් පාඩු**
**-------------------**

පහත අවස්ථා නිරීක්ෂණය විය.

(අ) සමාගමේ රු.561,708 ක අලාභයක් පැවතුන අතර, රු.14,151,194 ක් වටිනා ආයෝජන කල්පිරීමට පෙර රු.13,589,486 කට විකිණීම එයට හේතු විය.

(ආ) සමාගමේ සමාලෝචිත වර්ෂය තුළ බදු මුදල් ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් රු.40,986 ක දඩ මුදලක් ගෙවීමට සිදු වී තිබුණි.

## 4.2 කළමනාකරණ දුර්වලතා

-----------------------------

සමාගම 1985 වර්ෂයේ දී, වත්කම් දියුණුකිරීමේ ව්‍යාපාරයට ඇතුළත්ව විවිධාංගීකරණය කිරීමේ අරමුණින් නීතිගත කර තිබුණද, එවැනි කාර්යයන් සමාලෝචිත වර්ෂය තුළදී වත් ආරම්භ කර නොතිබුණි.

තවද සමාගමේ මූලික අරමුණ, 2007 අගෝස්තු 01 සිට අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ප්‍රවාහන ව්‍යාපාරයක් ලෙස වෙනස් කර තිබුණි. කෙසේ වෙතත්, කිසිදු ව්‍යාපාරයක් සැලසුම් කල පරිදි ආරම්භ කර නොතිබුණි.